දිවයින Online EDITION

පුවත්

# පුංචි ඡන්දය ප්‍රමාද කිරීම පිළිබඳව ආණ්ඩුවට නඩු

පැෆරල් සංවිධානය උසාවි යයි

රනිල් ධර්මසේන

පළාත් පාලන මැතිවරණය දිගින් දිගටම ප්‍රමාද කිරීමට එරෙහිව රජයට විරුද්ධව නඩු පැවරීමට පැෆරල් සංවිධානය තීරණය කර ඇත.

ආණ්ඩුවේ විවිධ පාර්ශ්ව විවිධ දිනයන් ප්‍රකාශ කරමින් හා හේතු ප්‍රකාශ කරමින් පළාත් පාලන මැතිවරණය කල් දමන බවත් මේ පිළිබඳව පළාත් පාලන ඇමැතිවරයාටත් මැතිවරණ කොමිසමටත් ලිතව දැනුම් දුන්න ද මෙතෙක් මැතිවරණය පැවැත්වීමට ක්‍රියා නොකළ බැවින් මෙලෙස ඉදිරි දින කිහිපය ඇතුළත නඩු පැවරීම සිදු කරන බව ද පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා 'දිවයින' ට පැවසීය.

හැකි ඉක්මනින් මැතිවරණය පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලෙසත් සීමානිර්ණය ගැටලු අවසන් කළ පළාත් පාලන ආයතනවල ප්‍රදේශ ගැසට් කරන ලෙසත් ගැටලු අවසන් නොවූ ඉතිරි ආයතනවල සීමා නිර්ණ අවසන් කරන ස්ථිර දිනයක් ප්‍රකාශයට පත්කරන ලෙසත් පැමිණිල්ල මගින් ඉල්ලා සිටින බව ද ඒ මහතා කීය.

පළාත් පාලන ඇමැතිවරයා, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හා ජාතික මැතිවරණ කොමිසම මෙහි වගඋත්තරුවන් බව ද හෙතෙම කියා සිටියේය.